# ගංජා සම්බන්ධ ශ්‍රී ලංකාවේ තත්වය



## ශ්‍රී ලංකාවේ ගංජා නීතියෙන් තහනම් ද ?



**ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය භාවිතය සඳහා පමණක් ගංජා යොදාගැනීමට නීතියෙන් අවසර ලබා දී ඇත.**

ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය ඖෂධ වෙනුවෙන් ගංජා සැපයීමට දීර්ඝ කාලයක් පුරා පැවතෙන වැඩපිළිවෙලක් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වේ.

## ගංජා ව්‍යාපාරය දේශිය ව්‍යාපාරයක් ද ?



ලෝක ගංජා ව්‍යාපාරය ගංජා ඒ ඒ රටවල දේශිය ව්‍යාපාරයක් ලෙස උලුප්පා දැක්වීමේ උපක්‍රමශීලි වැඩසටහනක් පසුගිය දශකය පුරාම ලෝකය තුල ක්‍රියාත්මක වීමක් දක්නට ලැබෙනවා.


උදාහරණයක් ලෙස අප්‍රිකානු රටවල සහ අසියාවේ බොහෝ රටවල ඒ ඒ රටවල්වලට ආවේණික දේශිය ව්‍යාපාරයක් ලෙස ගංජා හඳුන්වාදීමක් ලෝක ගංජා ව්‍යාපාරය විසින් දියත් කර තිබෙනවා.

## ලෝකයේ ගංජා නීතිගත කළ රටවල් තිබේනවා නේද ?



රටවල් 193 කට වැඩි සංඛ්‍යාවක් වන එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් අතරින් රටවල් දෙකක් පමණක් සහ තවත් රටවල් කිහිපයක ප්‍රාන්ත හෝ දිස්ත්‍රික් කිහිපයක් පමණක් මත්ද්‍රව්‍යක් ලෙස ගංජා භාවිතය නීතිගත කර ඇත. එවැනි නීතිගත කිරීම් සිදුවන්නේ මහාපරිමාණ බහුජාතික සමාගම් වල බලපෑම් මතය.

## ගංජා ව්‍යාපාරය පිටුපස සිටින්නේ කවුද ?



ලෝකයේ සිගරට් අලෙවිය දිනෙන් දින පහල යනවා. ශ්‍රී ලංකාව තුල **පසුගිය වසර 10 ඇතුළත සිගරට් අලවිය 65% කින් පහළ යනවා.**

මේ තර්ජනය සිගරට් සමාගම් බොහෝ කාලයක සිට නිරීක්ෂණය කරමින් සිටි නිසා පසුගිය දශකය තුළ දුම්කොළ සමාගම් මේ තර්ජනයට මුහුණ දීම සදහා ඔවුන්ගේ ඊළඟ ව්‍යාපාරය ලෙස ගංජා සදහා ආයෝජනය කරීම ආරම්භ කලා.




Big Tobacco
eyeing marijuana business

- "The use of marijuana ... has important implications for the tobacco industry in terms of an alternative product line. [We] have the land to grow it, the machines to roll it and package it, the distribution to market it."
- "Estimates indicate that the market in legalized marijuana might be as high as $10 billion annually."
  *From a report commissioned by cigarette manufacturer Brown and Williamson (now merged with R.J. Reynolds) in the 1970s.*




මීට අමතරව මධ්‍යසාර සමාගම් සහ බීම කර්මාන්තය දැනටමත් ඩොලර් බිලියන ගණනින් ගංජා ව්‍යාපාරයට ආයෝජනය කරමින් සිටී.

## මෑතකදී WHO එක ගංජා නීති වෙනස් කළාද ?




එක්සත් ජාතීන්ගේ 1961 සම්මුතියට අනුව මත්ද්‍රව්‍ය (drugs) සඳහා උපලේඛන 4 ක් ඇත. සෑම උපලේඛනයකට ඇතුළත් කර ඇති සියලුම මත්ද්‍රව්‍ය සම්මුතියට අනුව පාලනය කිරීමට යටත් වේ. උපලේඛන වෙනස් වන්නේ පාලන මට්ටම පමණි.

2020 දෙසැම්බර් 2 දින ගංජා සඳහා වන iv උපලේඛනයෙන් ඉවත් කරන ලද නමුත් එය i උපලේඛනයේ පවත්වාගැනීමට ඒකගවී ඇත. ඒ අනුව 2020 දෙසැම්බර් 2 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම **ගංජා වෛද්‍ය හා විද්‍යා විද්‍යාත්මක අරමුණකට හැර අනිකුත් කාර්මික වාණිජ විනෝදාත්මක සඳහා ඉඩ ලද ලබා නොදීමට තීරණයකරණු ලැබුවා.**

# ගංජා භාවිතය හානිදායක නැද්ද ?

ගංජා භාවිතයෙන් සිදුවන සෞඛ්‍යමය හානි බොහොමයකි. එය මානසික සහ ශරීරික රෝග ගණනාවකට බලපෑමක් ඇති කරයි.




| ශරීරයට | මනසට |
|---|---|
| වයසට වඩා වයසක පෙනුමක් ඇතිවීම | මානසික අවපීඩනය |
| ලිංගික බෙලහීනතාවය | භින්නෝන්මාදය |
| ප්‍රතිශක්තිය අඩුවීම | අවධාන ඌනතාවය සහ අධික්‍රියාකාරීත්ව රෝගය |
| ගංජා ගැට ( ඇවිදීමට අපහසුවීම ) | බුද්ධි අඩුවීම (IQ) |
| වෘෂණ කෝෂයේ පිළිකා | ඉක්මනින් තරහා යාම |
| උපදින දරුවන්ගේ ස්නායු දුර්වලතා (ගැබිනි මවගේ භාවිතය නිසා) | අන් අය සැකකිරීම |
| හෘදයාබාධ | මොළයේ හානි |
| නිදන්ගත පෙනහළු රෝග | විෂාදය |
| ආඝාතය හෙවත් අංශභාගය | |

ගංජා භාවිතය නිසා සිදුවන මානසික විකෘති තත්ත්වය නිසා සියදිවි හානි කරගැනීම් සහ ස්වයං හානිකර ගැනීම් බහුලව සිදුවේ. තවද පර්යේෂණ මගින් කංසා සෘණාත්මක ලෙස මොළයට බලපාන බව පෙන්වාදී තිබේ. සියලුම විද්‍යාත්මක පදනම් වලට අනුව ඇබ්බැහි වීමටත් සම්බන්ධකමක් ඇති කරයි. යොවුන් පරපුර සඳහා ගංජා මගින් නැවත නිවැරදි කිරීමට නොහැකි බලපෑමක් අති කරයි. ඒමෙන්ම වයස අවුරුදු 18 පෙර ගංජා භාවිතා කරන්න පටන් ගත් තරුණයන් ඒ සඳහා ඇබ්බැහි විමේ ශීඝ්‍රතාවය වැඩිකරයි.




ගංජා භාවිතා කිරීමෙන් අනතුරුව රිය පැදවීම රිය අනතුරු බහුලව සිදුවීමට බලපාන බව පර්යේෂණ මගින් අනාවරණය කරගෙන තිබේ.

# ගංජා දේශීය ඖෂධ සඳහා භාවිතා කරනවා නේද ?



ගංජා ඖෂධයක් ලෙස දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා භාවිතා කරනවා. නමුත් දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා දුමක් ලෙස ආග්‍රහණය කිරීම කිසිදු ආකාරයකින් අනුමත කිරීමක් සිදු නොකරන අතර ගංජා දුම ආග්‍රහණය කිරීම දේශීය වෛද්‍ය ක්‍රමය තුල දක්නට නොමැත. තවද දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා දුමක් ලෙස ආග්‍රහනය කීරීම රෝග රාශියකට හේතුවන බව පැහැදිලිව දක්වා ඇති අතර ඖෂධයක් ලෙස යොදාගන්නේ දීර්ඝ ක්‍රියාවලියකින් පසුවයි.

ගංජා දේශීය ඖෂධ සඳහා යොදා ගැනීමේදී එහි ඇති විෂ හරණයක් සිදුකරන ලබන අතර, ඒ සඳහා විවිධ උපක්‍රම භාවිතා කරනු ලබයි. උදාහරණ ලෙස එළගි තෙලෙහි බැදීමෙන් සහ තැබිලි වතුරෙන් තැම්බීම ආදී ක්‍රම මගින් ඒහි විෂ නසා ඖෂධ සඳහා භාවිතා කිරීමක් සිදුකරයි.

# ගංජා බටහිර ඖෂධ සඳහා භාවිතා කරනවා නේද ?



ගංජා ඖෂධිය වැදගත්කම ගැන බොහෝ ප්‍රකාශ නිකුත්වුවද , ගංජා ආශ්‍රිත ඖෂධ මගින් සුව වන්නේ යයි පැවසෙන රෝග ප්‍රමාණය ඉතා ස්වල්පයක් පමණකි. එමෙන්ම එම රෝග සඳහා ගංජා භාවිතා නොකර භාවිතා කල හැකි ඖෂධ බොහොමයක්ද ලෝකයේ ඇත. යම් රසායනිකයක් රෝගයකට ප්‍රතිකාර කිරීමේදී යහපත් බලපෑමක් ඇති කල ද එම රසායනය මත්ද්‍රව්‍යක් ලෙස භාවිතා කිරීම සඳහා ඉඩලබාදීම සුදුසු නොවේ. උදාහරණයක් ලෙස, පොපි ශාකයේ සාරය සහ එහි රසායනික ව්‍යුත්පන්නයන් ලොව පුරා වේදනා නාශක ඖෂධ ලෙස බහුලව භාවිතා වේ. නමුත් මෙම ශාකයෙන්ම ලබාගන්නා හෙරොයින් මත්ද්‍රව්‍යක් ලෙස භාවිතය සඳහා ප්‍රවර්ධනය කළ යුතු බව කිසිවෙක් පවසන්නේ නැත.

දැනට බටහිර වෛද්‍ය විද්‍යාවේ කංසා යොදාගෙන නිපදවා ඇත්තේ ඖෂධ දෙකක් පමණක් වන අතර ඒවායින් එකක් බ්‍රිතාන්‍යයේ NICE ආයතනයේ 2019 වසරේදී ඔවුන්ගේ අනුමත කිරීමේ ලයිස්තුවෙන් ඉවත් කරන ලදී.

# ගංජා වගාව ආර්ථික භෝගයක් නේද ?

ලෝකයේ ගංජා ව්‍යාපාරයට අවතීර්ණ වූ බොහෝ සමාගම් විශාල පාඩු ලබා ඇත. ලෝකයේ විශාලතම ගංජා වෙළෙඳුන් මේ වසරේදී ඩොලර් බිලියන ගණණක අලාභ වාර්තා කර තිබේ. මෙය ඔවුන්ගේ ව්‍යාපාර වල වටිනාකම පසුගිය වසරේ ඇමරිකානු ඩොලර් බිලියන 10 කට වඩා පහත වැටීමට අමතරව ය. ලෝක ගංජා (හෙම්ප්) තෙල් මිල 2019 සිට 75% වඩා පහත වැටී ඇති බවය. ගංජා නිශ්පාදන සදහා දැඩි අධි සැපයුමක් ඇති බැවින් ලෝකයේ ගංජා තෙල් නිශ්පාදන වල මිල විශාල ලෙස පහත වැටුණි.




එමෙන්ම අද ලංකාවේ දුම්කොළ වගාව බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමේ අණසක යටතට පත් කරගත්තා සේම මෙම ගංජා වගාව රටතුල ආරම්භ කර ඒහි අයිතිය දුම්කොළ සමාගම් යටතට පත්කිරීම සදහා කටයුතු සුදානම් වෙනවා.


**Sources :-**

https://www.cdc.gov/marijuana/health-effects.html
https://learnaboutsam.org/
https://movendi.ngo/.../narcotic-drugs.../marijuana-myths/
https://www.youtube.com/watch?v=2YU8Mnj5ZMo
https://www.youtube.com/watch?v=YGM98tMKflk&t=6s
https://www.youtube.com/watch?v=XohR7vPa_bo
https://www.youtube.com/watch?v=nlhKldnQwrM&t=2s
Sri Lanka Medical Association Media release (2020)
United Nations Commission on Narcotic Drugs (CND)
WHO web site



ADIC
Alcohol and Drug Information Centre
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org